# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 11,823 — 1959 ජූලි 31 වැනි සිකුරාදා — 31.7.1959**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


# IV වැනි කොටස — පළාත් පාලනය

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... | 649 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශ ... | — |
| තනතුරු—ඇබෑර්තු ... ... | — | අය-වැය ලේඛන ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... | — | දේපළ විකිණීම ... ... | — |
| අතුරු ව්‍යවසථා ... ... | 650 | මාර්ග කොමිටි දැන්වීම් ... ... | — |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් ... ... ... | — | විවිධ දැන්වීම් ... ... | 651 |


## පළාත් පාලන නිවේදන

ඇල්.ඕ—බී 13/59
අල්.ජී.ඕ.—ජී ජේ 9/35

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (201 වැනි පරිච්ඡේදයේ) 22 වැනි වගන්තිය යටතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ ගල්බඩ කෝරළේ ගම්ප්‍රදේශයේ ගම්කාරක සභාව විසින් සම්පාදිතව 1947 ක්වූ සැප්තැම්බර් මස 24 වන දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිතවූ එකී වගන්තියෙන් පළාත් පාලන හා නිවාස කටයුතු පිළිබඳ අමාත්‍ය තුමිය විසින් එතුමිය කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර සථිර කරන ලද නියෝග..

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ අමාත්‍ය
කාර්යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1959 යේ ජූලි මස 8 වැනි දින,
කොළඹදීය.

#### නියෝග

1. ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ ප්‍රකාශ කරන ලද සතුන් මරන පොදු ස්ථානය හා සතුන් මැරීම සඳහා නියම කරනු ලැබූ ස්ථාන සෞඛ්‍ය පරීක්ෂක තැන භාරයේ තිබිය යුතුය. ඒ සතුන් මරන ස්ථානයෙහි හා සතුන් මැරීම සඳහා නියම කරනු ලැබූ ස්ථාන යන්හි මනා පරිපාලනය හා සනීපාරක්ෂාව සම්බන්ධයෙන් ඒ නිලධාරි තැන විසින් වග කිය යුතුයි.

2. (1) කිසිම අයෙකු විසින් කිසිම සතකු—

(අ) ඒ සතා පරීක්ෂාකර බැලීම පිණිස කාර්ය සභාව විසින් පත් කරන ලද නිලධාරි තැන විසින් පරීක්ෂා කොට මිනිසුන්ගේ ආහාර පිණිස මරනු ලැබීමට සුදුසු යයි අනුමත කර තිබේ නම්, හෝ

(ආ) කිසියම් දිනක පූ. භා. 7 වත් 9වත් අතර කාලයේදී හෝ මිස නැත්නම් සතුන් මරන සථානයේදී හා සතුන් මැරීම සඳහා නියම කරනු ලැබූ කිසියම් සථානයකදී නොමැරිය යුතුයි; එහෙත් කවර අවසථාවකදී වුවත් මෙහි සඳහන් වේලාවට වඩා වෙනස්වූ යම් වේලාවක යම් සතකු මැරීම සඳහා ප්‍රධාන තුමා විසින් බලය දිය හැකියි.

(2) කිසිම අයෙකු විසින් කිසිම සතකු—

(අ) (1) වැනි ඡේදය යටතේ ඒ සතා මැරීම සඳහා අනුමත කළ වේලාවේ සිට පැය 72 ක කාලයක් ගතවූවාට පසු කොයියම් වේලාවක, හෝ

(ආ) (1) වැනි ඡේදය යටතේ අනුමත කළාට පසු ඒ සතා සතුන් මරන සථානයට අයිති භූමියෙන් හෝ සතුන් මැරීම සඳහා නියම කරනු ලැබූ කිසියම් ස්ථානයකදී පණ පිටින් ඉවත් කර ඇත්තේ නම්,

ඒ සතා නැවතත් පරීක්ෂා කොට මිනිසුන්ගේ ආහාර පිණිස මරනු ලැබීමට සුදුසුයයි (1) වැනි ඡේදය යටතේ අනුමත කරන ලද්දේ නම් මිස නැත්නම් සතුන් මරන ස්ථානයේදී හා සතුන් මැරීම සඳහා නියම කරනු ලැබූ කිසියම් ස්ථානයකදී නොමැරිය යුතුයි.

3. සතුන් මරන සථානයට හෝ සතුන් මැරීම සඳහා නියම කරනු ලැබූ සථානයකට යම් සතකු ගෙන එන සෑම අයෙකු විසින්ම ඒ සතා සතුන් මරන සථානයට අයිති භූමිභාගයෙහි නවත්වා සිටින කාලය තුළ ඒ සතාට සෑහෙන පරිදි කෑම, බීම නිසැකවම ලැබීම සඳහා අවශ්‍ය වූ සෑම පිළිවෙතක්ම යොදා ගත යුතුයි.

4. සතුන් මරන ස්ථානයට හෝ සතුන් මැරීම සඳහා නියම කරනු ලැබූ ස්ථානයකට යම් සතකු ගෙන එන සෑම අයෙකු විසින් ම ඒ සතා මරනු ලැබීමට සුදුසු නැතැයි ප්‍රතික්ෂෙපකරන ලද්දේ නම් එසේ ප්‍රතික්ෂෙප කළ වහාම ඒ සතා ස්ථානය පිහිටි භූමිභාගයෙන් ඉවත් කළ යුතුයි. නැතහොත් ඉවත් කරවිය යුතුයි.

5. යම් සතකු 2 වැනි නියෝගය යටතේ මැරීමට සුදුසුයයි අනුමත කළාට පසු ඒ සතා ලෙඩ සහිත බව හෝ මිනිසුන්ගේ ආහාර පිණිස මරනු ලැබීමට නුසුදුසු බව පෙනී ගියොත් සෞඛ්‍ය පිළිබඳ වෛද්‍ය නිලධාරි තුමා විසින් හෝ 2 වැනි නියෝගයේ සඳහන් නිලධාරි තැන විසින් හෝ ඒ සතා මැරීම තහනම් කළ හැකිසි.

6. සතුන් මරන ස්ථානයේදී හා සතුන් මැරීම සඳහා නියම කරනු ලැබූ කිසියම් ස්ථානයකදී මරන ලද යම් සතකුගේ මස් හෝ අතුනු බහන් ආදිය සෞඛ්‍ය පිළිබඳ වෛද්‍ය නිලධාරි තුමාගේ නොහොත් 2 වැනි නියෝගයේ සඳහන් වූ නිලධාරි තැනගේ කල්පනාවේ හැටියට ලෙඩ සහිතව හෝ මිනිසුන්ගේ ආහාරයට නුසුදුසුව තිබේ නම් එතුමා විසින් ඒ මස් හෝ අතුනුබහන් ආදිය වහාම විනාශකර දැමීමට සැලැස්විය යුතුයි. එසේ නැතහොත් ඒ මස් හෝ අතුනුබහන් ආදිය විකිණීම පිණිස තැබීම හෝ මිනිසුන් විසින් ආහාර පිණිස ගැනීම හෝ වලකින අන්දමින් ඉවත් කරවිය යුතුයි.

7. සතුන් මරන ස්ථානය හා සතුන් මැරීම සඳහා නියම කරනු ලැබූ කිසියම් ස්ථානයක් භාරවූ නිලධාරි තැන විසින් මිනිසුන්ගේ ආහාරය පිණිස මරනු ලැබීමට සුදුසුයයි අනුමත කර නැත්තාවූ හෝ 5 වැනි නියෝගයේ විධිවිධාන පරිදි මැරීම තහනම් කර තිබෙන්නාවූ හෝ කිසිම සතකු මස් පිණිස මැරීමට අවසර නොදිය යුතුයි.

8. (1) කිසිම් අයෙකු විසින් මිනිසුන්ගේ ආහාරයට නුසුදුසු යයි 6 වැනි නියෝගය යටතේ ප්‍රකාශ කරන ලද කිසිම මසක් හෝ අතුනු බහන් ආදියක් සෞඛ්‍ය පිළිබඳ වෛද්‍ය නිලධාරි තුමාගේ නොහොත් 2 වැනි නියෝගයේ සඳහන් වූ නිලධාරි තැනගේ නියමය යටතේ මිස නැත්නම් සතුන් මරන ස්ථානයෙන් හෝ සතුන් මැරීම සඳහා නියම කරනු ලැබූ ස්ථානවලින් ඉවත් නොකළ යුතුයි.

(2) කිසිම අයෙකු විසින් මිනිසුන්ගේ ආහාරය පිණිස අදහස් කරන ලද යම් සතකුගේ කුණපය, ඒ කුණපයේ ඉස්සරහ ගාත් වලත් පස්සා ගාත්වලත් සතුන් මරන ස්ථානය හෝ සතුන් මැරීම සඳහා නියම කරනු ලැබූ කිසියම් ස්ථානයක් භාරවූ නිලධාරි තැන විසින් "ග.ස.ග.කෝ." (V. C. G. K.) යන මුද්‍රාව පිහිටුවා තිබේනම් මිස නැත්නම් සතුන් මරන ස්ථානයෙන් හෝ සතුන් මැරීම සඳහා නියම කරනු ලැබූ ස්ථානයෙන් ඉවත් නොකළ යුතුයි.

9. වෙනත් යම් සතකු ඉදිරියේදී හෝ ඒ ස්ථානයෙහි කලින් මරන ලද සෑම සතකුගේම කුණපය ඉවත්කර හෝ මුවාකර ස්ථාන ශුද්ධ පවිත්‍ර කරන තුරු හෝ කිසිම සතකු නොමැරිය යුතුයි.

10. (1) කාරණයේ හැටියට සතුන් මරන ස්ථානය හෝ සතුන් මැරීම සඳහා නියම කරනු ලැබූ ස්ථානය පාවිච්චි කිරීම සඳහා පහත සඳහන් වන අන්දමේ ගාස්තුවක් කාර්‍ය සභාවට කලින් ගෙවිය යුතුයි. ගාස්තුව ගෙවූ බවට සාක්ෂ්‍යයක් වශයෙන් කාර්‍ය සභාවේ කාර්‍යාලයෙන් ලබාගත් කුවිතාන්සියක් නැතුව කිසිම සතකු මැරීමට ඉඩ නොදිය යුතුයි :—

හරකුන් සඳහා එකකුට ... ... රු. 5.00

බැටළුවන්, එළුවන් හෝ ඌරන් සඳහා එකකුට ... රු. 2.00

(2) මිනිසුන්ගේ ආහාරය පිණිස මරණු ලැබීමට සුදුසු මෙන් 2 වැනි නියෝගය යටතේ සතකු අනුමත කර තිබෙන විට ඒ සතා, සතුන් මරණ ස්ථානයට හෝ සතුන් මැරීම සඳහා නියම කරනු ලැබූ ස්ථානයට ඇතුල් කිරීමට ප්‍රථමයෙන් ගාස්තුව ගෙවූ බවට සාක්ෂියක් වශයෙන් කාර්‍ය සභාවේ කාර්‍යාලයෙන් ලබාගත් කුවිතාන්සියක් පෙන්වා සිටීම වුවමනා නොකෙරෙයි.

11. සතුන් මරන ස්ථානය හෝ සතුන් මැරීම සඳහා නියම කරනු ලැබූ ස්ථානය භාර අය විසින් සතුන් මරන ස්ථානයට හෝ සතුන් මැරීම සඳහා නියම කරනු ලැබූ ස්ථානයට ගෙන එන ලද සියලුම හරකුන්ගේ රෙජිස්ටරයක් මේ සමග තිබෙන පෝර්මයෙහි පරිදි තබා ගත යුතුයි :—

| සරක් කුවිතාන්සියේ අං. | විස්තර | පාට | වයස | හංනිවරන | | මස් මරන්නාගේ නම | සරක් කොටුවට ඇතුල් කළ දිනය | පරීක්ෂාකර බැලූ දිනය | ගෙන ගිය දිනය | බෙහිදුර් කරන්නා | සරක් බාර ගත් හා නිලධාරී තැනගේ කෙටි අත්සන |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | දකුණු පැත්ත | වම් පැත්ත | | | | | | |
| | | | | | | | | | | | |

12. මේ නියෝගවල—

"ප්‍රධානතුමා" යනුවෙන් කාර්‍ය සභාවේ ප්‍රධාන තුමා අදහස් කරනු ලැබේ ;

"කාර්‍ය සභාව" යනුවෙන් ගල්බඩ කෝරළේ ගම් ප්‍රදේශයේ ගම් කාර්‍ය සභාව අදහස් කරනු ලැබේ ;

"ආඥාපනත" යනුවෙන් මස් පිණිස සතුන් මැරීමේ ආඥාපනත (201 වැනි පරිච්ඡේදය) අදහස් කරනු ලැබේ.

---

ජී. 229.

## ගම්සභා ආඥාපනත

### නිවේදනයයි

1947තේ සැප්තැම්බර මස 24 වැනි දින අංක 9,773 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළමු ප්‍රකාශනයෙන් සංශොධිත ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදය) 11 වැනි වගන්තියෙන් මා කෙරෙහි පැවරී ඇති බලයේ ප්‍රකාර, පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ අමාත්‍ය විමලා විජේවර්ධන වන මා විසින් :—

1956 යේ අගෝස්තු මස 17 වැනි දින අංක : 10,962 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් සංශෝධිත 1940 හේ මාර්තු මස 29 වැනි දින අංක 8,597 දරණ ගැසට් පත්‍රයේ ඊට යාකොට ඇති උපලේඛණයෙහි පළවූ, මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ ඇතැම් ගම්ප්‍රදේශවල ගම්මුලාදෑනි කොට්ඨාශ, ඡන්දදායක කොට්ඨාශවලට නැවත බෙදා වෙන්කිරීම හෝ ඒකාබද්ධ කිරීම පිළිබඳ නිවේදනය, එහි "උඩුගොඩ පල්ලේසිය පත්තු ගම් ප්‍රදේශය" යන ශීර්ෂය යටතේවූ "පදුඅන්ග" යන වචනය අස්කොට ඒ වෙනුවට "මහවත්ත" යන වචනය යෙදීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

විමලා විජයවර්ධන,
පළාත් පාලන හා නිවාස කටයුතු පිළිබඳ
අමාත්‍යවරීය.

1959 ක්වූ ජූලි මස 14 වැනි දින,
කොළඹදීය.

---

# අතුරු ව්‍යවසථා

ජී.සී/14/60.

## ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදය) 49 වැනි වගන්තිය යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ කුන්චුට්ටු කෝරළේ ගම්ප්‍රදේශයේ, ගම්කාර්ය සභාව විසින් සම්පාදිතව, 1947 තේ සැප්තැම්බර මස 24 වැනි දින අංක 9,773 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළවූ ප්‍රකාශනයෙන් මදක් වෙන් කරනලද එකී වගන්තියෙන් පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ ඇමති වරිය කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමිය විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ අමාත්‍ය
කාර්යාංශයේ ස්ථාවර ලේකම්තැන.

1959 යේ ජූලි මස 10 වැනි දින,
කොළඹදීය.

### අතුරු ව්‍යවස්ථා

1. කාර්ය සභාව විසින් සම්මත කරගන්නා ලද අශුචි ඉවත් කිරීම හා කසලශෝධනය පිළිබඳ පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 6 වැනි අතුරු ව්‍යවස්ථාවේ දක්වෙන කාරණා සඳහා කාර්ය සභාව වෙත ගෙවියයුතු මාසික අශුචි ඉවත් කිරීමේ ගාස්තු එක් එක් බාල්දිය සඳහා රුපියල් එක බැගින් වියයුතු වන්නේ ය.

2. කාර්ය සභාව විසින් සම්මත කරගන්නාලද අශුචි ඉවත් කිරීම හා කසළ ශෝධනය පිළිබඳ පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 11 වැනි අතුරු ව්‍යවසථාවේ දක්වෙන කාරණා සඳහා කාර්ය සභාව වෙත ගෙවිය යුතු මාසික කසල ශෝධන ගාස්තුව ශත පනහ බැගින් වියයුතු වන්නේ ය.

3. මේ අතුරු ව්‍යවසථාවල "කාර්ය සභාව" යනුවෙන් අනුරාධපුර දිස්ත්‍රික්කයේ කුන්චුට්ටු කෝරළේ ගම්ප්‍රදේශයේ ගම්කාර්ය සභාව අදහස් කරනු ලැබේ.

ඇල් .ඕ—ඕ 81/46.

ඇල් .ජී.ඕ.—ජී.ඒ. 11/14/8.

### ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපණතේ (198 වැනි පරිච්ඡේදය) 49 වෙනි වගන්තිය යටතේ නුවර එළිය දිස්ත්‍රික්කයේ උඩපලාත ගම්ප්‍රදේශයේ ගම් කාර්‍ය සභාව විසින් සම්පාදිතව, 1947 සැප්තැම්බර් මස 24 වෙනි දින අංක. 9,773 දරණ ''ගැසට්'' අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිත වූ එකී වගන්තියෙන් පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ ඇමති තුමිය කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමිය විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාවයි.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ අමාත්‍ය කාර්‍යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1959 ජූලි මස 10 දින,
කොළඹදීය.

### අතුරු ව්‍යවස්ථාව

උඩපලාත ගම් ප්‍රදේශයේ ගම්කාර්ය සභාව විසින් සම්පාදිතව 1954, ජූනි මස 25 වෙනි දින අංක. 10,685 දරණ "ගැසට්" පත්‍රයේ පළ කරන ලද අතුරු ව්‍යවස්ථා, ඒවායේ අතුරු ව්‍යවස්ථාවේ (2) වැනි ඡේදයේ සඳහන් "ශත විසිපහ" යන වචන වෙනුවට "ශත පනහ" යන වචන යෙදීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

## විවිධ දැන්වීම්

### පිස්සු බලු රෝගය

ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් පිළිබඳ පිස්සු බලු රෝග ආඥා පනතේ 11 වැනි වගන්තිය ප්‍රකාර (333 වැනි පරිච්ඡේදය) කුරුණෑ ගල නාගරික සභාවේ පාලන සීමා ඇතුළත පිහිටි කිසියම් ප්‍රසිද්ධ ස්ථානයක හෝ පාරක හෝ පෞද්ගලික ගොඩනැගිල්ලක්, විදුහලක්, ගෙවත්තක් නොවන කිසියම් ස්ථානයක සිටින නොබඳින ලද හෝ දක්කා ගෙන නොයන ලද කිසියම් බල්ලකු මා විසින් ලියවිල්ලකින් දෙන ලද බලය ලත් කිසියම් පුද්ගලයකු විසින් එවේලෙහිම විනාශ කර දමනු ලැබේ.

මෙම ප්‍රකාශනය 1959 අගෝස්තු මස 11 වෙනි දින සිට මාස හයක් වලංගු වන්නේ ය.

අරල් ද අල්විස්,
නාගරික කොමසාරිස්, කුරුණෑගල.

නාගරික සභා කාර්‍යාලය,
කුරුණෑගල,
1959 ජූලි 24 වැනිදය.